**2026.05.12 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
13. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
14. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
15. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
16. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
17. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
18. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
19. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
20. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
21. බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
22. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

සහභාගී නොවූ :-

1. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා,

ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය හා ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා යන මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

<u>**ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරුන් ද, ප්‍රාදේශීය සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම :-**

1.1. 2026.04.21 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.35 ට ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා හා ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>

2026.04.21 දින පැවති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සභිකයින් වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

සංශෝධන ඉදිරිපත් නොවූ බැවින් 2026.04.21 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් කරන ලද යෝජනාව, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-**

2.1. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 80(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ සියලු සභිකවරුන් ද වාර්ෂිකව සිය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු පුද්ගලයින් ලෙස නම් කර ඇත. ඒ අනුව 2026 වර්ෂයට අදාළව සභිකයින් සිය 2026 වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශය මාර්තු මස 31 දින සිට ජුනි මස 30 දින දක්වා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කළ යුතු ය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා වෙබ් අඩවිය වෙත ප්‍රවේශ වී එහි මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය හරහා ඔබ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු ය. දූෂණ විරෝධී පනතට අනුකූල නොවීම, වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම, අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම එකී පනතේ 90 වැනි වගන්තිය යටතේ වරදක් වන බවත්, එබැවින් සියලු මන්ත්‍රීවරුන් නියමිත කාලය තුළ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසත් නිවේදනය කරමි.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-** කිසිවක් නැත

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-** කිසිවක් නැත

**5. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**5.1. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>**

5.1.1. සභාවේ අත්තිකාරම් ගිණුමෙහි 2014.02.24 දින සිට 2014.07.01 දක්වා වූ මාස 06 ක කාලයක් සඳහා එච්. ටී. පී. රූපසිංහ යන අයට ගෙවන ලද රු. 50,778.00 ක තාවකාලික විශ්‍රාම වැටුපක ශේෂයක් පවතින අතර අවුරුදු 45 ඉක්මවා රාජ්‍ය සේවයට ඔහු බඳවාගෙන ඇති බැවින් විශ්‍රාම වැටුපකට හිමිකම් ලබා නොමැත. 2024.09.26 දිනැති ලිපිය මඟින් ඔහුගේ පදිංචිය පිළිබඳ සිදු කළ විමසීමක දී 2024.02.08 දින ඔහු මියගොස් ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. ඒ අනුව මෙම ශේෂය අවසන් ගිණුමෙන් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
අවසන් ගිණුම තුළ මෙම ශේෂය දක්වා තිබීම හේතුවෙන් මෙය විගණනය සමඟ දිගින් දිගටම පැමිණි කාරණයක් බවත්, විශ්‍රාම වැටුප් අවසන් ගිණුම්වලින් කපා හැරීම කළ නොහැකි බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන මෙය ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ හා ප්‍රරෝහණය කිරීමේ කාර්යය සඳහා පොදු පරිපාලන අධිකාරය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇත. එකී සෞඛ්‍ය බලතල ක්‍රියාත්මක කිරීමේ දී බල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ක්‍රියා කළ යුතු අතර ඒ සඳහා සෘජුවම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත සභාවට හෝ සභාපතිවරයාට පැවරුණු සෞඛ්‍ය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වන බලය පැවරීමක් කළ යුතු බැවින් 1987 අංක 15 දරන පනත ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරුණු සෞඛ්‍ය බලතල සහ තවදුරටත් ප්‍රාදේශීය සභාව වෙත පහත පනත් හා ආඥා පනත්වලින් පැවරුණු කරුණුවලට අදාළ බලතල කාර්යය සහ කර්තව්‍යය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉටු කිරීමෙහිලා පහත වැඩිමනත් විස්තර සඳහන් ඉඳුරුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය ලෙස සලකා පිළිගෙන ක්‍රියාකිරීමටත් ඔවුන්ගේ රාජකාරී බල ප්‍රදේශයට අදාළව ප්‍රාදේශීය සභාව සහ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත පැවරුණු පහත පනත් හා ආඥාපනත්වලට අදාළ සෞඛ්‍ය බලතල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත සහ ඒ ඒ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8(2) සහ 216 වැනි වගන්ති ප්‍රකාරව පැවරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

1. 1862 අංක 15 දරන පීඩන ක්‍රියා ආඥා පනත
2. 1893 අංක 09 දරන සෝගාතන ආඥා පනත
3. 1941 අංක 13 දරන ජල භීතිකා රෝගය පිළිබඳ ආඥා පනත

| නම | තනතුර | රාජකාරී බල ප්‍රදේශය |
|---|---|---|
| නයෝමි විජේවර්ධන | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය |
| කේ. ජී. වයි. තිස්ස | පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක (වැ.බ.) | බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය |
| වයි. පී. ආර්. එස්. ලක්මාල් | මහජන සෞඛ්‍ය පරීක්ෂක | බෙන්තොට මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| සී. පී. කේ. සේනාධිරත්න | මහජන සෞඛ්‍ය පරීක්ෂක | රන්තොටුවිල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| ආර්. ඩී. ටී. නයනජිත් | මහජන සෞඛ්‍ය පරීක්ෂක | හබුරුගල II මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| එම්. ඩී. එස්. කුමාර | මහජන සෞඛ්‍ය පරීක්ෂක | ඉඳුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |
| පී. පී. සිරිමාන්න | මහජන සෞඛ්‍ය පරීක්ෂක | ගෝනගල මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ප්‍රාදේශීය සභා පනත අනුව මෙම බලතල ප්‍රාදේශීය සභාව වෙත පැවරී තිබුණ ද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරහා මෙම කටයුතු ඉටුවන බවත්, නමුත් ඔවුන්ට නීත්‍යානුකූලව මෙම බලතල මෙතෙක් පවරා නොමැති බැවින් මෙම බලතල පවරා දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, උඩබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>

ප්‍රාදේශීය සභා පනතේ 78 (2) උප වගන්තිය මඟින් මෙම බලතල පවරා ඇති බැවින් නැවත පැවරීමක් සිදු කළ යුතු වන්නේ ද පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 09.43 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා</u>

ප්‍රාදේශීය සභා පනතේ 8(2) වගන්තිය අනුව සභාපතිවරයා සතු බලතල පැවරිය හැකි වන්නේ උප සභාපතිවරයා, ලේකම් ඇතුළු සභාවේ නිලධාරියෙකුට පමණක් වන බවත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සභාවේ නිලධාරීන් පිරිසක් නොවන බැවින් ඔවුන් සභාවේ කාර්ය මණ්ඩලය ලෙස පිළිගෙන බලතල පැවරීමක් සිදු කළ යුතු වන බවත්, මෙතෙක් බලතල නොපැවරීම මත ඔවුන්ට නඩු කටයුතු සඳහා යොමු වීමේ ගැටලු පැවති බවත්, ප්‍රාදේශීය සභා පනතේ 78(2) වගන්තිය අනුව

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විමසා ප්‍රාදේශීය සභාව මගින් IV කොටසට අදාළ සෞඛ්‍ය බලතල ක්‍රියාත්මක කළ යුතු බවත්, නමුත් එමගින් සෞඛ්‍ය බලතල පවරා දීමක් පිළිබඳ සඳහන් කර නොමැති බවත් මෙහි දී පැහැදිලි කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 09.45 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3. ආයතනය සංවිධානය කරන උත්සව සහ විශේෂ අවස්ථාවලදී ද, ආයතනය නියෝජනය කර සහභාගී විය යුතු බැහැර රැස්වීම් වැඩසටහන්වලදී ද භාවිතයට ගත හැකි ආයතනයේ අනන්‍යතාවය සහිත නිල ඇඳුමක් නොමැත. එබැවින් අවශ්‍යතාවය පරිදි සේවයට වාර්තා කිරීමේදී ද ඇඳීමට හැකි පරිදි කාර්ය මණ්ඩලය සහ මන්ත්‍රී මණ්ඩලය වෙත සභාවේ නම සහිත ටී-ෂර්ට් 01 බැගින් සභා අරමුදලින් ලබා දීම සුදුසු බවටත් ඒ හේතුවෙන් සභා අරමුදලින් රු. 250,000/- ක වැය බරක් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

බෙන්තොට ප්‍රාදේශීය සභා සුභ සාධක සංගමය මගින් සකස් කරගත් ටීෂර්ටයක් මේ වන විට නිලධාරීන් හා සේවකයන් විසින් භාවිත කරනු ලබන බවත්, පසුගිය දින පැවති අලුත් අවුරුදු උළෙලේ දී මන්ත්‍රීවරු ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා පොදුවේ සභාවේ අනන්‍යතාවය පිළිබිඹු වන ලෙස ටීෂර්ටයක් සකස් කර තැබීම උචිත වන බව පෙනීගිය බවත්, ඒ අනුව සභා අරමුදල් මගින් සියලු දෙනාට ටීෂර්ට් 01 බැගින් ලබා දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.4. ගෝනගල දූව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.5. මුල්ලගොඩ පාම්මඩුවත්ත සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.6. හබක්කල හෙට්ටිගොඩ ප්‍රධාන මාර්ගයේ දිග අඩි 240 ක් හා පළල අඩි 9 ක් පමණ වන මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.7. තේක්කවත්ත ඉඳුරුවෙල මාර්ගයේ දිග අඩි 416 ක් හා පළල අඩි 09 ක් පමණ වන මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.8. රන්තොටුවිල ප්‍රධාන මාර්ගයේ සිට පැටි මහතාගේ නිවස දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.9. මොරගොඩ පන්සල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස දිගින් දිගටම ඉල්ලීම් කළ බවත්, සියලු දෙනාම පොදුවේ භාවිත කරනු ලබන මාර්ගයක් බැවින් මෙය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.10. කෝම්මල සමගි මාවතේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කොට මාර්ගය තාර දමා සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.2. <u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.2.1. මහගොඩ ඥාණිස්සර මාවත 03 වන පටුමග ප්‍රදීප් ගුණවර්ධන මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2. හොරවල ප්‍රධාන මාර්ගයේ සිට කුමාර ගුණවර්ධන මහතාගේ නිවස දක්වා රෝහල ඉදිරිපිටින් දිවෙන මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීමට සුදුසු ලෙස පස් ඉවත් කොට සමතලා කොට කොන්ක්‍රීට් යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.3. මහගොඩ ඥාණිස්සර මාවත 04 වන පටුමග පී.වී. ආරියදාස මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කර සෑදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.4. හොරවල පන්සලට යන මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් යොදා සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.5. මහගොඩ ඥාණිස්සර මාවත පස්වන පටුමග තාර හෝ කොන්ක්‍රීට් යොදා සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.3.** <u>**ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.3.1. රන්තොටුවිල කොට්ඨාසයට ග්‍රාම නිලධාරී වසම් පහක් අයත් වන අතර එම මාර්ගයන්හි සවිකර ඇති වීථි පහන් බොහොමයක් අක්‍රියව ඇත. ඒ නිසා පළමු අදියර යටතේ ප්‍රධාන මාර්ගයෙහි ඇති අක්‍රීය වීථි පහන් හෝ සවි කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා**</u>

පසුගිය සතියේ අවස්ථා 02 ක දී රන්තොටුවිල කොට්ඨාසයේ වීථි පහන් සවි කිරීමේ කටයුතු සිදුකිරීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත්, ඒ සඳහා ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා ද තම වීථි පහන්වලින් කොටසක් ලබා දී දායකත්වය දැක්වීම පිළිබඳ එතුමාට ද ස්තූතිවන්ත වන බවත්, දිරාපත් වී ඇති කොටස් බොහොමයක් ද පවතින බැවින් ඉදිරියේ දී එම අල්ලු ද සහිතව වීථි පහන් ලබා දීමට කටයුතු කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.2. හබුරුගල - මහ ඌරගහ ප්‍රධාන මාර්ගයෙහි රන්තොටුවිල මංසන්ධියේ සිට ගුරුහේන්ගොඩ කුලසිංහ මහතාගේ නිවස අසල දක්වා අබලන් වී ඇති මාර්ගය අලුත්වැඩියා කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා**</u>

අවස්ථා කීපයක දී ප්‍රතිසංස්කරණය කළ ද මේ වන විට නැවතත් ඉතාම අබලන් තත්ත්වයේ පවතින මාර්ගයක් වන බවත්, මෙය අලුත්වැඩියා කර දීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
මොරගොඩ පන්සල මාවත ප්‍රතිසංස්කරණය සඳහා මුදල් වෙන් කරනු ලබන බැවින් එම කොට්ඨාසයේම වෙනත් මාර්ගයක සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අපහසු වන බවත්, ඉදිරියේ දී ලැබෙන ප්‍රතිපාදන මත මෙම මාර්ගය අලුත්වැඩියා කිරීමට සලකා බලන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.4.** <u>**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.4.1. ඉඳුරුව රජයේ රෝහල ඉදිරිපිට මාර්ගයේ ජලය බැසයාම සඳහා යාලේගම ප්‍රධාන මාර්ගයේ ඇති කාණුව දක්වා බැකෝ යන්ත්‍රය දමා කපා දීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 09.50 ට ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

<u>**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**</u>
රෝහලේ සිට මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය දක්වා වන කොටසේ රොහල් භූමියේ ඇති කාණු පද්ධතිය අවහිර වී ඇති බවත්, බැකෝ යන්ත්‍රය මඟින් එම කාණු පද්ධතිය සකස් කර දීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.2. ඉඳුරුව රජයේ රෝහල් භූමියේ ඇති ලයිට් කණු සඳහා විදුලි බල්බ සවි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
මේ වන විට විදුලි බල මණ්ඩලය මඟින් සවිකර ඇති විදුලි වයරවලින් කණු සඳහා විදුලිය ලබා ගැනීමට නොහැකි බවත්, මේ හේතුවෙන් විදුලි පහන් කණුවලට විදුලිය ලබා ගත හැකිවන විදුලි රැහැන් පද්ධතියක් සවි කර දෙන ලෙස සම්බන්ධීකරණ කමිටුව හරහා විදුලි බල මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.3. ඉඳුරුව රජයේ රෝහලේ කැලි කසල දමන වල හාරා පිරිසිදු කර දෙන ලෙස යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>
බැකෝ යන්ත්‍රය මඟින් මෙම වල පිරිසිදු කර දීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.4. ඉඳුරුව ඔලගන්දූව මාර්ගයේ කාපට් මාර්ගයේ අවසානයේ සිට ඉදිරියට සුසාන භූමිය දක්වා මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.5. <u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.5.1. වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ මුණසිංහ වත්ත ගයාන් හෝටලය ඉදිරිපිට මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.2. වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව කැබැල්ලකන්ද මාර්ගය ප්‍රිමික්ස් හෝ තාර දමා ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.3. ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ ඇලකාක ගිනිගලවත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.4. තොටකනත්ත ග්‍රාම නිලධාරී වසමේ තොටකනත්ත මාගල පාර බෙරතුඩුව හරස් පාර ප්‍රිමික්ස් දමා ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.5. ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ පියැද්ද පාර ප්‍රිමික්ස් දමා ප්‍රතිසංස්කරණය කිරීමට සහ එම පාර දෙපස පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.6. <u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.6.1. මහ ඌරගහ ප්‍රධාන පාරේ සිට මඩකුඹුර මාර්ගයේ මීටර් 200 ක් පමණ දුරින් බෝධිය ළඟින් ඇති පටුවගොඩ මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.2. කුඩා ඌරගහ දිද්දුගොඩ මාර්ගයේ බටදූව පළවන හරස් මාර්ගය සද්ධාසේන මහතාගේ නිවස දක්වා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.3. මහ ඌරගහ මඩකුඹුර මාර්ගයේ ඌරගස් ඇළ හරහා ඇති පටු පාලමේ අනාරක්ෂිතභාවය අවම කර ගැනීම සඳහා ආරක්ෂිත වැටක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් වමින්ද මැතිතුමා</u>**

මෙම පාලම සකස් කර අවුරුදු 15 ක් පමණ වන බවත්, ගල් සහිත මාර්ගයක් වන බවත්, ඉතා පටු පාලමක් වන බැවින් එහි ආරක්ෂිත වැටක් ඉදි කර දෙන ලෙස ගම්වාසීන්ගේ දැඩි ඉල්ලීමක් පවතින බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.00 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

මීට පෙර පූජ්‍ය ශ්‍රීලාල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ ආරක්ෂිත වැට සභාවේ පවතින යකඩවලන් සෑදීමට උපදෙස් දුන් බවත් එය ඉදි කිරීම සම්බන්ධව වර්තමාන ප්‍රගතිය පිළිබඳ මෙහි දී විමසන ලදී.

**<u>තාක්ෂණ සේවා නිලධාරී, එස්. ඩී. සමරනායක මහතා</u>**

සභාව සතුව පවතින යකඩවලින් මෙම ආරක්ෂිත වැට ඉදි කිරීමට නොහැකි බවත්, මේ වන විට අවශ්‍ය ද්‍රව්‍ය ඉල්ලුම් කර ඇති බවත්, ඒවා ලබා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතින බවත් මෙහි දී සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.03 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.7. <u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.7.1. තපෝදාරාම පන්සල පාර 03 වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි. (14 A මිරිස්වත්ත)

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.2. ගල්වලහේන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි. (14 D පිලේකුඹුර)

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.3. මිරිස්වත්ත හොරවල ප්‍රධාන මාර්ගයේ සිට ගුණවර්ධන මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි. (14 A මිරිස්වත්ත)

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.8.** <u>**ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.8.1. ඇටවල සිට දන්වත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා**</u>
මෙම මාර්ගයට රු. 35,000/- ක තම පුද්ගලික වියදමින් ABC කියුබ් 03 ක් දැමූ බවත්, තාර දමා ඉතිරි කටයුතු අවසන් කර දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
ගමන් කිරීමට ඉතාම අපහසු මාර්ගයක් බවත්, සභාවෙන් සිදු කළ යුතු කටයුත්තක් වුව ද තම පුද්ගලික වියදමින් ABC දැමීම පිළිබඳ සභාවේ සභාපතිවරයා ලෙස ගරු මන්ත්‍රීතුමන්ට ස්තුතිය හා ගෞරවය පුද කර සිටින බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.9. <u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.9.1. තුඩුව උළුකැපුවත්ත ප්‍රධාන මාර්ගය මීටර් 30 ක් පමණ ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.2. සූරියගම භාෂිත මහතාගේ නිවස අසල සිට රවී මහතාගේ නිවස දක්වා මීටර් 30 ක පමණ කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.3. දෙද්දුව මහගෙදරවත්ත ප්‍රධාන මාර්ගයේ (විලියම් ගුණරත්න පාර) අබලන් වී ඇති මීටර් 30 ක පමණ කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.4. දෙද්දුව බොල්ගොඩ මාර්ගයේ ජයලත් මහතාගේ නිවස අසල සිට සුසාන භූමියට හැරෙන ස්ථානය දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.5. දංකැටිය ජේම්ස් සමරසිංහ මාවත මීටර් 30 ක් පමණ තාර දමා අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
මෙම මාර්ගයේ කොටසක් තාර දමා ඇති බවත්, එහි ඉතිරි මීටර් 30 ක පමණ කොටස ද තාර දමා අවසන් කිරීම සුදුසු බවත් සඳහන්කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.10. <u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.10.1 කොටකිලල බේකරිය පාර සංවර්ධනය කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කර සිටිමි.
එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.2. කපුගස්දූව ගුණානන්ද මාවත සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.3. කැකිරිගත්හේන පාර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.11. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.11.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික සේවා ගණයේ එනම් PL වැටුප් පරිමාණයේ තනතුරුලාභීන් කාලයක සිට ආයතනයේ සේවා අවශ්‍යතාවය මත වෙනත් තනතුරුවලට අනුයුක්ත කර රාජකාරී පැවරීම් කර ඇත. ආයතනයේ විවිධ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව 06 ක් පමණ වේ. ආයතනයේ රථ වාහන 13 ක් පමණ ඇති නමුදු අනුමත රියදුරු සංඛ්‍යාව 05 කි. වර්ග කිලෝමීටර් 74.5 ක පමණ බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 51 ක ප්‍රදේශයන් තුළ සියලු ප්‍රාදේශීය සභා සේවා ඉටු කිරීමේ දී පවත්නා කාර්ය මණ්ඩලය මඟින් එකී සේවා කළමනාකරණය කර ගැනීම ගැටලුකාරී වේ. නමුත් වගකිවයුතු පළාත් පාලන

ආයතනයක් ලෙස මහජන සේවා අඛණ්ඩව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ අභියෝගයකට අප මුහුණ දී ඇත. තව ද මෙම වෙනත් තනතුරුවලට අදාළ රාජකාරී පැවරීම් සිදුකර තිබුණේ මෑතක දී නොවන අතර ඇතැම් සේවකයින් බඳවාගනු ලැබූ දින සිටම වෙනත් තනතුරකට අනුයුක්ත කර රාජකාරී පැවරීම් සිදුකර ඇත. එවැනි සේවකයින් වෙනත් තනතුරුවලට යොදාගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මහ සභාවේ එකඟතාවය ලබා ගෙන කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමන් විසින් අංක GS/SP/03/02/06 හා 2026.04.24 දාතමින් දැනුම් දී ඇත. එබැවින් එකී කරුණු අනුව සලකා පහත සඳහන් සේවකයින් වෙත දැනට පවරා ඇති වෙනත් තනතුරුවලට අදාළ රාජකාරී ඉටු කිරීම සේවා අවශ්‍යතාවයක දී හෝ වෙනත් ඕනෑම අවස්ථාවක දී නිත්‍ය තනතුරේ රාජකාරී සඳහා යෙදවීමේ කොන්දේසියට යටත්ව තවදුරටත් එලෙසම පවත්වාගෙන යාම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පවරනු ලබන රාජකාරිය |
|---|---|---|---|
| 01 | ඩී.එන්.ලියනගොඩ මිය | කාර්යාල කාර්ය සහායක | ආදායම් අංශයට අනුයුක්තව මිශ්‍ර ආදායම් රාජකාරී |
| 02 | එල්.එච්.ලලිත් මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | වැඩ ඒකකයේ රාත්‍රී මුර සේවය |
| 03 | ප්‍රියන්ත ගුණතිලක මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | විදුලි අංශයේ රාජකාරී ඉටු කිරීම |
| 04 | එම්.කේ.අමිල රුවන් කුමාර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | විදුලි අංශයේ රාජකාරී ඉටු කිරීම |
| 05 | එම්.කේ.එන්.ආරියරත්න මයා | කම්කරු | විදුලි අංශයේ රාජකාරී ඉටු කිරීම |
| 06 | කේ.ඒ.කෝසල මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | ට්‍රැක්ටර් රියදුරෙකු වශයෙන් රාජකාරී ඉටු කිරීම. |
| 07 | යූ.කේ.ජී.චාමරී මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | ඉඳුරුව හා බෙන්තොට නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක ලෙස රාජකාරී ඉටු කිරීම. |
| 08 | ඒ.කේ.ටෙක්ලා නිරුෂානි මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | හබුරුගල උප කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක ලෙස කටයුතු කිරීම. |
| 09 | කසුන් උදාර ගුණසේකර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක ලෙස රාජකාරී ඉටු කිරීම. |
| 10 | එම්.අජිත් කුමාර මයා | කම්කරු | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක ලෙස රාජකාරී ඉටු කිරීම. |
| 11 | එච්.එම්.දිලුනි භාග්‍යා මිය | වැඩ ක්ෂේත්‍ර කම්කරු | පෙරටු කාර්යාල නිලධාරී ලෙස රාජකාරී ඉටු කිරීම. |
| 12 | එම්.එස්.ගුණසේකර මිය | කම්කරු | ආදාහනාගාර සහායක වශයෙන් රාජකාරී ඉටු කිරීම. |
| 13 | ඩබ්.එල්.නිශ්ශංක අල්විස් ගුණතිලක මයා | බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු සහායක | රියදුරු රාජකාරී ඉටු කිරීම. |
| 14 | කේ.ඒ.දිමුතු ලසන්ත මයා | විදුලි කාර්මික | බැකෝ යන්ත්‍ර සහායක ලෙස රාජකාරී ඉටු කිරීම. |

| | | | |
|---|---|---|---|
| 15 | එස්.ජී.ධම්මික මයා | සෞඛ්‍ය කම්කරු | ඉඳුරුව උප කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක රාජකාරී ඉටු කිරීම. |
| 16 | කාල් දමිත් වාද්දුවගේ මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | ප්‍රධාන කාර්යාලය පිරිසිදු කිරීමේ කටයුතු ඉටු කිරීම. |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙය කාලෝචිත සේම නීත්‍යානුකුල කරුණක් වන බවත්, මේ වන විට අප සභාවේ විවිධ තනතුරුවල රාජකාරී සිදු කළා වුව ද මෙම 16 දෙනා හිටපු සභාපතිවරුන්ගේ කාල සීමාවල දී කම්කරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු ආදී තනතුරු සඳහා බඳවා ගෙන ඇති බවත්, බඳවාගත් දින සිටම ඔවුන් සේවා අවශ්‍යතාවය මත වෙනත් තනතුරුවල රාජකාරී ආවරණ කටයුතු සිදු කළ බවත්, ඊට හේතුව ආයතනයේ නිත්‍ය තනතුරු කීපයකම කාලයක් තිස්සේ පවතින පුරප්පාඩු වන බවත්, මෙම සියලු දෙනා අදාළ තනතුරුවල පිහිටවුවහොත් ආයතනය පවත්වාගෙන යාමේ දී දැඩි දුෂ්කරතාවයන්ට පත්වන බවත්, මෙතෙක් රජයෙන් එම තනතුරුවල පුරප්පාඩු පිරවීමට උත්සාහ නොගත් බවත්, මෑතක දී මෙම සේවකයන්ව නිත්‍ය තනතුරේ පිහිටුවන ලෙස ආණ්ඩුකාරතුමන්ගේ නියෝගයක් ලැබුණු නමුත් අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කර ආණ්ඩුකාරතුමන් වෙත කරුණු දක්වා ඉල්ලීම් කළ පසු මහ සභාවේ අනුමැතිය මත එලෙස සේවයේ යොදවා ගන්නා ලෙසට දැනුම් දුන් බවත්, ඒ අනුව මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළු කළ බවත්, හිටපු සභාපතිවරයෙක් රජයේ නිලධාරීන්ට විරුද්ධව ප්‍රකාශයක් කිරීම හේතුවෙන් එකම පක්ෂයේ සිටිය ද තමන් එම සභාපතිවරයාට විරුද්ධව යෝජනාවක් පවා ගෙන ආ මන්ත්‍රීවරයෙක් වන බවත්, තමා සභාපතිවරයා වූ පසු ද රාජ්‍ය සේවකයින් වෙනුවෙන් පෙනී සිටින බවත්, ඒ හේතුවෙන් පෙර සභාපතිවරුන් බඳවා ගත් කිසිම අයෙකු පාරට දැමීමට කටයුතු නොකරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

මෙම රාජකාරී ආවරණ කටයුතු සිදු කරන සේවකයින් එම කටයුත්ත හොඳින් සිදු කරන බවත්, නමුත් මෙම ගැටලුව නැවත වෙනත් සභාපතිවරයෙකුගේ කාල සීමාවක දී ඇතිවිය හැකි බැවින් ඔවුන්ට අවශ්‍ය මූලික සුදුසුකම් හෝ සම්පූර්ණ කර තැබීම සුදුසු වන බවත්, එසේම දැනට සිදු කරනු ලබන තනතුරට අනුයුක්තියක් ලබා දීමේ හැකියාවක් පවතී නම් එය සිදු කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

බොහෝ තනතුරු සඳහා විශේෂ සුදුසුකම් අවශ්‍ය නොවන බවත්, එසේ අවශ්‍ය වන්නේ ඖෂධ සංයෝජක, රියදුරු හා විදුලි කාර්මික වැනි තනතුරු සඳහා පමණක් වන බවත්, ඉන් විදුලි කාර්මික තනතුරේ රාජකාරී ඉටු කරන දෙදෙනෙක් මේ වන විට ඊට අදාළ වෘත්තීය පුහුණු සුදුසුකම් සපුරාගෙන ඇති බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීශාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මෙය පූර්වාදර්ශයක් ලෙස ඉදිරියට නොවන්නට වගබලා ගැනීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

වෙනත් තනතුරුවලට සේවයට පැමිණ පසුව සුදුසුකම් සපුරා ගන්නා අයව සේවයේ ස්ථිර කළ නොහැකි බවත්, නමුත් එම තනතුරුවල පුරප්පාඩු පිරවීමේ දී අලුතින් බඳවා ගැනීම් සිදු කිරීමට වඩා සුදුසුකම් සපුරා

ඇති අයට ප්‍රමුඛතාවය දීමට කටයුතු කරන බවට පළාත් පාලන කොමසාරිස්තුමා දැනුම් දුන් බවත්, ඒ සඳහා සභාව මඟින් ද ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.2. බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි තරුණ ප්‍රජාවගේ ක්‍රීඩා කුසලතා උරගා බැලීම, ක්‍රීඩාව තුළින් සෞඛ්‍යසම්පන්න හා විනයගරුක පුරවැසියෙකු බිහි කිරීම ආදී බහුවිධ අරමුණු සාක්ෂාත් කරගනුවස්, බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ සහ රාජ්‍ය ආයතනවල සහභාගීත්වයෙන් යුතු සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම සුදුසු බවටත්, එහි වියදම් සඳහා සභා අරමුදලින් රු. 135,000/- ක වැය බරක් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 10.25 ට ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

සභාවක් ලෙස හැමදාම සිදු කරනු ලබන කසල ඇදීම, ලයිට් දැමීම, පාරවල් සුද්ද කිරීම ආදියට අමතරව සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි මාසයකට එක් වැඩසටහන බැගින් වර්ෂයකට වැඩසටහන් 12 ක් සිදු කිරීමට ලේකම්තුමා සමඟ සාකච්ඡා කළ බවත්, එමඟින් තරුණ පිරිස සභාව සමඟ බද්ධ කර ගැනීමට හැකියාවක් ලැබෙයැයි අපේක්ෂා කරන බවත්, එලෙසම මෙහි තවත් අරමුණක් ඇති බවත්, අපේ ක්‍රීඩා පිටිය නඩත්තු කළ ද ඉන් ආදායමක් නොලබන බැවින් මෙලෙස ක්‍රීඩා තරඟ ආදිය පැවැත්වීම මඟින් ක්‍රීඩා පිටිය ක්‍රිකට් පිච් එකක් ලෙස සකස් කිරීමට හැකි වන බවත්, ඉන් පසු එය වෙනත් ආයතන වෙත ක්‍රීඩා තරඟ පැවැත්වීම සඳහා ලබා දීමට හැකිවන බවත් සඳහන් කළ අතර මේ වන විට එහි නඩත්තු කටයුතු සිදු වන ආකාරය පිළිබඳව ද විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

පිච් එක මේ වන විට සකස් කර ඇති බවත්, පස් ලබා ගැනීමේ ප්‍රමාදයක් පවතින බවත්, එය ලැබුණු පසුව JCB යන්ත්‍රය යොදා ගනිමින් පිච් එක අවට පවතින වලවල් කිහිපයක් පුරවා භූමිය සකස් කර ගත හැකි බවත්, පසුගිය දිනවල ඒ අවට ළමුන් පැමිණ එහි ක්‍රීඩා කළ බවත් පැහැදිලි කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.3. අප සභාවට අයත් ඉඳුරුව, දංවත්ත, ඇටවල රබර් ගහ හන්දියේ බස් නැවතුම්පොළක් ලෙස භාවිත කරනු ලබන ස්ථානයේ ප්‍රදේශවාසීන්ගේ මූල්‍ය දායකත්වය මත තාවකාලික බස් නැවතුම්පොළක් ඉදි කිරීමට අවසර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**</u>

මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් වන බවත්, මෙය ප්‍රදේශවාසීන්ගේ මූල්‍ය දායකත්වය මඟින් සිදු කරන බවත්, ඒ සඳහා සභාවේ අවසරය ලබා දීම සුදුසු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.4. ඉදුරුව බණ්ඩාරනායක මාවත දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එම මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.5. බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවසන් වරට වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු කර තිබෙනුයේ 2018 වර්ෂයේ ය. ඒ අනුව ප්‍රාදේශීය සභාව මඟින් ඉල්ලීම් කරනු ලදුව 2026 වර්ෂයේ දී තක්සේරු ප්‍රතිශෝධන කටයුතු සිදු කර දීමට තක්සේරු දෙපාර්තමේන්තුව එකඟ වී ඇත. එම දෙපාර්තමේන්තුවේ ඉල්ලීම අනුව දේපළ තක්සේරුකරණයේ යෙදෙන නිලධාරීන් සඳහා සහයකයින් ලෙස කම්කරුවන් 10 දෙනෙකු ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ප්‍රාදේශීය සභාවේ දැනට සිටින කම්කරුවන් 10 දෙනෙකු ඒ වෙනුවෙන් යෙදවීම සභාවේ දෛනික රාජකාරී බිඳ වැටීමට හේතුවන අතර එලෙස යෙදවිය හැකි ප්‍රමාණවත් කම්කරුවන් පිරිසක් ද නොමැත. එබැවින් තක්සේරු ප්‍රතිශෝධන කාර්යයට පමණක් අදාළ වන ලෙස සහ එම කටයුතු නිම වූ පසු සේවය අවසන් කිරීමට යටත්ව කම්කරුවන් 10 දෙනෙකු සභා අරමුදලින් අනුමත වැටුප් හා දීමනා ගෙවීමට යටත්ව සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.6. 2026 ජුනි මස 05 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව මඟින් ශ්‍රමදාන, පාසල් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළත් වැඩසටහන් මාලාවක් පැවැත්වීම සුදුසු බවටත්, ඒ වෙනුවෙන් ඇස්තමේන්තුගත රු. 132,000/- ක මුදලක් සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.12. <u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.12.1. බෙන්තොට හුංගන්තොට ප්‍රධාන මාර්ගයේ සිට දිවෙන කොටපිටියවත්ත පාර (පළමු පටුමගේ) ජලයෙන් යටවන මීටර් 20 ක පමණ කොටසක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.2. බෙන්තොට, ආරච්චිමුල්ල කෝම්මල පාරේ සිට දිවෙන උස්වත්ත පටුමග මීටර් 40 ක් පමණ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.3. බෙන්තොට ආරච්චිමුල්ල - කෝම්මල පාරේ සිට දිවෙන ගොරකදූව පාරේ කෙළවර නිතර ජලයෙන් යටවෙන මීටර් 40 ක පමණ කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.4. බෙන්තොට සෝනුත්තර මාවතෙහි අබලන්ව පවතින වලවල් පෙර සවි තාර මිශ්‍රණය කියුබ් 02 ක් යොදා ප්‍රතිසංස්කරණය කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.5. බෙන්තොට සෝනුත්තර මාවතේ සිට පාරමිතා පෙර පාසලට යන හරස් පාරේ කෙළවර සෝදා පාලුවට ලක් වෙමින් පවතින කොටස ආරක්ෂා කිරීමට කොන්ක්‍රීට් පැති කාණුවක් සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.13. <u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.13.1. සිංහරුපාගම, සුද්ධගොඩ ප්‍රධාන මාර්ගයේ දිලිප් මහතාගේ නිවස යාබද වමට ඇති මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට හේමන්ත මහතාගේ මහගෙදර දක්වා ඇති මීටර් 75 ක පමණ මාර්ගය කොන්ක්‍රීට් හෝ තාර අතුරා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.2. සිංහරුපාගම ශ්‍රේස්විලා එක පසුකර මහතුන්මාමලාගේ කඩේ පසුකර වමට හැරුණු විට ආරම්භක ස්ථානයේ සිට අවසානය දක්වා ඇති මීටර් 60 ක පමණ මාර්ගයේ පදිංචි නිවාස 05 ක් තිබෙන බැවින් එය තාර හෝ කොන්ක්‍රීට් අතුරා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිනව සභා සම්මත විය.

**5.14. <u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.14.1. බෙන්තොට ගෝමටේ ධර්මපාල විද්‍යාලය ඉදිරිපිට බෙන්තොට ඇල්පිටිය ප්‍රධාන මාර්ගයේ ඇති අනතුරුදායක දුරකතන රැහැන් කණුව ගලවා පිටුපසට හෝ වෙනස් කිරීමට කටයුතු කරන මෙන් සභාව මඟින් ටෙලිකොම් ආයතනය වෙත ලිපියක් යොමු කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>
මෙම ස්ථානයේ අනතුරු කීපයක්ම සිදු වූ බවත්, සභාව මඟින් මෙම කණුව පවතින ස්ථානය වෙනස් කරන ලෙස ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බවත්, පුද්ගලිකව ඉල්ලීම සිදු කළ විට ඒ සඳහා යම් ගාස්තුවක් අය කරනු ලබන බවත්, මේ නිසා මහජන ආරක්ෂාව උදෙසා මෙය සිදු කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.15. <u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.15.1. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මේ දිනවල දුම්රිය හරස් මාර්ගයේ කණ්ණාඩි සවි කරන අතර එය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවල පමණක් සවි කරනු ලබයි. එම කණ්ණාඩි අප සභාවට අයත් පහත මාර්ගවල ඇති දුම්රිය හරස් මාර්ගවල ද සවි කරන ලෙස පළාත් මර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටින ලෙස යෝජනා කරමි.

- ඉඳුරුව ගල්බඩ බණ්ඩාරනායක මාර්ගයේ දුම්රිය හරස් මාර්ගය
- අතුරුවැල්ල දුම්රිය හරස් මාර්ගය
- වරාහේන දුම්රිය හරස් මාර්ගය

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>
මෙය ඉතාම හොඳ වැඩපිළිවෙළක් බවත්, නමුත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවල පමණක් මෙම කණ්ණාඩි සවි කිරීමට කටයුතු කරන බවත්, ඉහත සඳහන් අනෙකුත් දුම්රිය හරස් මාර්ගවල පවතින අනතුරුදායක බව හේතුවෙන් එම ස්ථානවල ද කණ්ණාඩි සවි කිරීම සුදුසු වන බවත්, එම නිසා එම ආයතනයෙන් ඉල්ලීමක් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එම ආයතනයෙන් ඉල්ලීම් කිරීමට අමතරව මෙම යෝජනාව සභාවේ ඒකමතික තීරණයක් ලෙස සම්බන්ධීකරණ කමිටුවට මෙන්ම මාර්ග ආරක්ෂණ කමිටුවට ද යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.16. <u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.16.1. දෙහිගහවෙල "ලූල්වලයාය" මාවතෙහි තැනින් තැන කඩතොළු වී ඇති හෙයින් එම මාවත අලුත්වැඩියා කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය**</u>

මෙම මාර්ගයේ තැනින් තැන ලොකු වලවල් පවතින බවත් ගමන් කිරීමට අපහසු බැවින් එම මාර්ගය සකස් කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.2. අංක 09 කයිකාවල ග්‍රාම සේවා වසමට අයත් අඹගහවත්ත, පාළුගෙදර වත්ත මැදින් වැටී ඇති මීටර් 140 ක් පමණ දිග මාවත තාර හෝ කොන්ක්‍රීට් දමා පිළිසකර කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය**</u>

මෙම මාර්ගයේ පවුල් 15 ක් පමණ පදිංචිව සිටින බවත්, මෙම මාර්ගය සාදා දෙන ලෙස එම ප්‍රදේශවාසීන්ගෙන් දැඩි ඉල්ලීමක් පවතින බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.3. කන්දෙමුල්ල නිහාල් කහවෙවිතාරණ මහතාගේ නිවසත් අබේවික්‍රම මහතාගේ නිවසත් දක්වා මාවතෙහි ජලය බැස යාමට ප්‍රධාන කාණු පද්ධතියක් දැමීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.4. කන්දෙමුල්ල කණිටු විදුහල කේන්ද්‍රකරගෙන ආයුර්වේද වෛද්‍ය සායනයක් පැවැත්වීමට අවශ්‍ය ඖෂධ හා ආයුර්වේද කාර්ය මණ්ඩලය ලබා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>

ලේකම්තුමන් සමඟ සාකච්ඡා කොට ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරගන්නා ලෙස සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.17.** **<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.17.1. හිපන්වත්ත මහ ඌරගහ ප්‍රධාන මාර්ගයේ පාලම පුපුරා ඇත. එම පාලම අලුතින් දැමීමට අවශ්‍ය ආයතන වෙත යොමු කරන මෙන් ගරු සභවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>
හිපන්වත්ත ප්‍රධාන මාර්ගය මේ වන විට සාමාන්‍ය තත්ත්වයට පත් කර ඇති නමුත් පාලම කැඩී ගොස් ඇති බවත්, සභා අරමුදල් මඟින් මෙය සකස් කළ නොහැකි වුවත් වෙනත් අවශ්‍ය ආයතන වෙත යොමු කොට මෙම පාලම සකස් කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.18.** **<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.18.1. හබුරුගල පුවක්වත්ත මාර්ගයේ හබුරුගල ධර්මරාජ විද්‍යාලය අසල සිට ඉම්ර ස්ටෝර්ස් දක්වා කොටසේ කාණු පද්ධතිය JCB යන්ත්‍රය යොදා පිරිසිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
පාසල ළඟටවත් ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත්, කාණු සම්පූර්ණයෙන්ම ගොඩ වී ඇති බවත්, කාණු අවහිර බැවින් වතුර පාරට ගැලීම නිසා පාරේ තාර තට්ටු ගැලවී යාමට ඉඩ ඇති බවත්, වැඩ පරීක්ෂක මහතා එම ස්ථානය පරීක්ෂාවට ගිය බවත්, සභාවේ කම්කරුවන් මඟින් එම කටයුත්ත සිදු කිරීම අපහසු බව පෙනී ගිය බවත්, JCB යන්ත්‍රය මඟින් පැයක පමණ වැඩ කොටසක් මඟින් මෙය ඉටු කළ හැකි බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා</u>
මෙම යෝජනාව ඉටු කළ යුතුම යෝජනාවක් බවත්, ඊයේ දිනය වන විට ද එහි ජලය පිරී දුර්ගන්ධයක් ද පැවති බවත්, මදුරුවන් ද බෝවී ඇති බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.19.** **<u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.19.1. වියන්දූව වසමේ වියන්දූව වත්ත කොටසේ නිමල් මහාගේ නිවස අසල සිට කුමාර මහතාගේ නිවස දක්වා මාර්ගය දෙපස කාණු පද්ධතිය වැසි ජලය බැස යන ලෙස සකසා දෙන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.19.2. වියන්දූව වත්ත කොටසේ නිමල් මහතාගේ නිවස අසල සිට පැලපොල්වත්ත මාර්ගයේ මීටර් 30 ක් පමණ කොටස තාර හෝ කොන්ක්‍රීට් යොදා සකසා දෙන ලෙස ගරු සභාවට යොජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2026.03.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.03.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දුෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2026.04.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.04.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දුෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.3. 2026.04.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.04.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දුෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**7.1. <u>2026 අප්‍රේල් මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026 අප්‍රේල් මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2026 අප්‍රේල් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 12,409,614.96 |
| එකතු කළා මූලධන ලැබීම් :- | - |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 12,409,614.96** |
| සේවක ණය | රු. 516,511.00 |
| තැන්පත් | රු. 35,600.00 |
| දේපළ ණය පොළී | රු. 10,955.82 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 5,000.00 |
| බලපත්‍ර බදු | රු. 7,300.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 2,425.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 104,015.00 |
| එකතුව | **රු. 13,091,421.78** |
| 2026 අප්‍රේල් මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 11,893,217.93 |
| එකතු කළා -ප්‍රාග්ධන වියදම් | රු. 1,124,406.28 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 13,017,624.21** |
| දේපළ ණය පොළී | රු. 10,955.82 |
| තැන්පත් | රු. 422,886.11 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 83,780.00 |
| සේවක ණය | රු. 1,065,000.00 |
| මුද්දර බදු | රු. 19,270.00 |
| ණය හිමියෝ | රු. 50,000.00 |
| එකතුව | **රු. 14,669,516.14** |

**7.2. <u>2026. 04.30 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.04.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරන පොදු ජංගම ගිණුම, අංක 81618288 දරන සේවක ණය ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**7.3. 2026.04.30 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026.04.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 4,593,788.15 |
| 2. අක්කර බදු | රු. 191,448.00 |
| 3. 1 % බදු | - |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 15,700.00 |
| 8. වෙළඳ ස්ථාන කුළී | - |
| 10. වෙළඳ බලපත්‍ර ගාස්තු | රු. 13,000.00 |
| 12.ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු | - |
| **එකතුව** | **රු. 4,813,936.15** |

**7.4. ගෙවීම් වවුචර් අනුමත කිරීම.**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | | WIMAL AGRO TRACTORS (PVT) LTD | කොම්පෝස්ට් අංගනය සඳහා යන්ත්‍ර සූත්‍ර උපකරණ මිල දී ගැනීම යටතේ ට්‍රැක්ටර් ටේලර් 02 ක් මිල දී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | රු. 1,640,200.00 |
| 02 | | කුඩා උරගහ ග්‍රාමීය බැංකුවේ ගැමුණු ග්‍රාම සංවර්ධන සමිතියේ ගි.අ. 25002 | අංක 40 කුඩා උරගහ දිද්දුගොඩ සිට බටදූව දක්වා යා කෙරෙන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 975,453.08 |
| 03 | | බෙන්තොට සමූපකාර ග්‍රාමීය බැංකුවේ මෛත්‍රී වැඩිහිටි සමිතියේ ගි.අ. 1025433 - 9 | කෝම්මල ග්‍රාම නිලධාරී වසමේ සුද්ධගොඩ - සිංහරුපාගම මාර්ගයේ (කනටියවත්ත ප්‍රජා ශාලාව මාවත) කෙළවර මීටර් 15 ක ප්‍රමාණය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 146,566.12 |
| 04 | | බෙන්තොට ලංකා බැංකුවේ දැහැමි වැඩිහිටි සමිතියේ ගි.අ. 89844922 | සර්කියුලර් පාරේ සිට පොල්වත්ත පාරේ (හරස් පාර) කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 223,471.82 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | | බෙන්තොට ග්‍රාමීය බැංකුවේ මෛත්‍රී වැඩිහිටි සමිතියේ ගි.අ. 1025433 - 9 | කෝම්මල ආරච්චිමුල්ල ඉදිගහගොඩැල්ල අතුරු මාර්ගයේ කෙළවර දැනට කොන්ක්‍රීට් කර නැති මීටර් 56 ක ප්‍රමාණය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 558,622.80 |
| 06 | | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අතුරුවැල්ල ගොවි සංවිධානයේ ගි.අ. 215011500132 | අතුරුවැල්ල පන්සල මාර්ගයේ උඩ කොටසේ මීටර් 40 ක් පමණ වන නිවාස 03 කට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 282,893.58 |
| 07 | | ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශක්ති වැඩිහිටි සමිතියේ ගි.අ. 215011500090 | මැදගොඩවත්ත මාර්ගය කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 952,981.26 |
| 08 | | හබුරුගල ග්‍රාමීය බැංකුවේ මහගොඩ සමෘද්ධි ගොවි සංවිධානයේ ගි.අ. 1012242 - 3 | මහගොඩ නාගහ උඩුමුල්ල පාර අවසාන කන්ද කොටස නිල්මිණී මහත්මියගේ නිවස අසල සිට ගාමිණී මහතාගේ නිවස අසල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම | රු. 486,722.57 |
| 09 | | හබුරුගල ග්‍රාමීය බැංකුවේ මහගොඩ සමෘද්ධි ගොවි සංවිධානයේ ගි.අ. 1012242 - 3 | මහගොඩ ගල්වැටියවත්ත පාර මීටර් 70 ක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් මුදල ගෙවීම | රු. 677,370.68 |

ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**8. වෙනත් කරුණු**

**8.1.** **<u>ටෙන්ඩර් හා මිල ගණන්</u> :-** නැත

**8.2.** **<u>ඇස්තමේන්තු හා ගිවිසුම් සහාගත කිරීම</u> :-**

8.2.1. ඇස්තමේන්තු අංක 01 :-

ව්‍යාපෘතියේ නම :- රන්තොටුවිල ආචාරිගේවත්ත පාලම ඉදි කිරීම

මුදල :- රු. 10,739,628.34

8.2.2. ඇස්තමේන්තු අංක 02 :-

ව්‍යාපෘතියේ නම :- බෝගහවත්ත කන්දෙමුල්ලට පිවිසෙන මාර්ගය ප්‍රතිසංස්කරණ කිරීම

මුදල :- රු. 951,200.03

ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**8.3. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම :-**

**ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා**

තොටකනත්ත කුසුමරුක්ඛාරාම විහාරස්ථානය ඉදිරිපිට මහල් 4 කින් සමන්විත කඩ කාමර කීපයක් ඉදි කිරීමට කටයුතු කරමින් පවතින බවත්, විවිධ පාර්ශ්ව කීපයකින් ඒ සඳහා බාධා පැමිණ ඇති බවත්, විහාරස්ථානය පවත්වාගෙන යාම සඳහා කිසිඳු ආදායම් මාර්ගයක් මෙතෙක් නොමැති බවත්, ඒ හේතුවෙන් සභාව මඟින් ලබා දිය හැකි යම් සහයෝගයක් වෙතොත් එය ලබා දී කඩ කාමර ඉදි කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා**

මෙම කොටස විහාරස්ථානයේ පොදු භූමියක්, පූජා භූමියක් ලෙස වසර ගණනාවක සිට පවතින්නක් වන බවත්, මේ වන විට එය ගොඩ කර පිහිටි පොළව මට්ටමටම පැමිණ ඇති බවත්, එහි විහාරාධිපතිහිමියන්ගේ ඉල්ලීම පරිදි ගරු සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන් ද දැනුවත් කර එය නීත්‍යානුකූල කර ගැනීම සඳහා එම ඉල්ලීම යෝජනාවක් ලෙස සම්බන්ධීකරණ කමිටුවට යොමු කර ඇති බවත්, හෙට දින එය සාකච්ඡා කිරීමට නියමිත බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා**

විදුලි බල මණ්ඩලයෙන් නව විදුලි පහන් කණු සිටුවන විට උස විදුලි පහන් කණු සිටුවා ඇති බවත්, මේ නිසා විදුලිය ලබා ගැනීමේ දී පැරණි විදුලි පහන් කණුවලට වඩා උස බැවින් මෙම නව විදුලි පහන් කණුවල අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සභාවේ ඇති ඉනිමං මඟින් අපහසු බවත්, මේ නිසා පවතින ඉනිමඟට වඩා විශාල ඉනිමඟක් ගැනීම හෝ විදුලි බල මණ්ඩලය දැනුවත් කර විදුලි පහන් පහළින් සවි කරවා ගැනීම සුදුසු බවත්, මේ හේතුව නිසා දැනට වසර 5 කට අධික කාලයක් ස්ථාන කිහිපයක ලයිට් දැමීමට නොහැකි තත්ත්වයක් පවතින බවත් සඳහන් කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

මේ වන විට කෲ කැබ් රථය යම්තාක් දුරකට අලුත්වැඩියා කටයුතු කර ඇති බවත්, එය විදුලි අංශයේ කටයුතු සඳහා ලබා දෙන බවත්, එවිට එහි තට්ටුව මත සිට ඉනිමඟ තබා නැඟීමට හැකිවන නිසා එම විදුලි පහන් අලුත්වැඩියා කිරීමට හැකියාව ලැබෙනු ඇති බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, විජිත් සම්පත් මැතිතුමා**

හිපන්වත්තට යන ප්‍රධාන මාර්ගයේ මාර්ගය අයිනේ මාර්ගයට බරව පවතින අඹ ගසක් ඉවත් කිරීමට ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් සභා වාර කීපයකට පෙර ඉදිරිපත් කළ යෝජනාව මෙතෙක්

ක්‍රියාත්මක වී නොමැති බවත්, මේ වන විට එම ගස මාර්ගය හරහා වර්ධනය වෙමින් බවතින බවත්, මීට මාස 11 කට පමණ පෙර ඊ - සභා ඇප් එක හරහා මෙම ගස පිළිබඳ පැමිණිල්ලක් දමා ඇති බවත්, ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කරන බව එහි දී පිළිතුරු ලෙස ලැබී තිබූ බවත්, නැවත ඒ පිළිබඳ සොයා බලන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

මාර්ගය අයිනේ එම අඹ ගස පවතින බවත්, එහි මුල් නිසා මාර්ගයේ දමා ඇති කාපට් එකට හානි වන බවත්, තාක්ෂණ සේවා නිලධාරී රොෂාන් මහතා ස්ථානීය පරීක්ෂාවක් සඳහා එම ස්ථානයට ගිය බවත් මෙහි දී සභාව දැනුවත් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

රොෂාන් මහතා මේ වන විට ස්ථාන මාරු ලබා ඇති බැවින් පහළගම්භය උප කාර්යාලයේ නව තාක්ෂණ සේවා නිලධාරී සම්පත් මහතාට එම ස්ථානය පරීක්ෂා කොට බලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, විජිත් සම්පත් මැතිතුමා</u>

එසේම හිපන්වත්තේ නුග ගසක් සම්බන්ධවත් පැමිණිල්ලක් ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කර තිබූ බවත්, ඒ අනුව අදාළ පාර්ශ්වයන් වෙත ගස ඉවත් කිරීමට සභාවෙන් ලිපි යවා තිබූ බවත්, මෙතෙක් ගස ඉවත් කර නොමැති බවත්, මේ දිනවල පවතින අයහපත් කාලගුණික තත්ත්වය හමුවේ අනතුරක් සිදු වීමට ප්‍රථම මෙම ගසේ අතු හෝ කපා ඉවත් කර දෙන ලෙසත්, මෙවැනි අනතුරුදායක ගස් තවත් තිබේ දැයි සොයා බලා ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට යෝජනා කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

එම ඉඩම තමන් සතු ඉඩමක් වන බවත්, තාක්ෂණ සේවා නිලධාරීන් විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත්, එම ඉඩම සඳහා නඩුවක් පවතින බවත්, ඒ හේතුවෙන් ගස ඉවත් කිරීමේ හැකියාවක් නොමැති බවත්, සභාව මඟින් එම ගස ඉවත් කිරීම සුදුසු වන බවත්, ඒ සඳහා කිසිදු විරෝධතාවයක් නොමැති බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>

බෙන්තොට අයිඩා එක පසු කර යන විට හමුවන මංගල මාවතේ මීට වසර ගණනාවකට පෙර කාපට් ඇතිරූ බවත්, එහි දී මාර්ග සංවර්ධන අධිකාරියට දැන්වූවත් ඔවුන් එහි තිබූ ගල් නියමිත ක්‍රමවේදයකට ආවරණය නොකර කාපට් ඇතිරීම නිසා එම හිඩැස්වලින් කාපට් ගලා ගොස් කාණුවල සවි වී කාණු අවහිර වීම නිසා කාණු පද්ධතිය හරහා ජලය බැස නොයන බවත්, එය සභාවට අයත් කාණු පද්ධතියක් නොවන බවත්, වර්ෂා කාලවල දී ප්‍රධාන කාණු පද්ධතියේ ජලය බැසයාමේ අවහිරතාවය හේතුවෙන් ඒ අවට කඩ සාප්පු ජලයෙන් යටවන බවත්, ඒ හේතුවෙන් සභාව මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර මෙම කාණු පද්තිය පිරිසිදු කර දෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් සිදු කරන බවත්, එසේම ගාලු පාරේ සංචාරක මණ්ඩලයට අයත් පැත්තේ ඒ අවශ්‍ය ස්ථානය පෙන්වා සභාවට මුදල් ගෙවා ඒ ස්ථානයේ දැන්වීම් පුවරු සවි කර තිබෙන බවත්, පසුගිය දිනවල මාර්ග සංවර්ධන අධිකාරියෙන් පැමිණ එම පුවරුවල දැන්වීමක් අලවා ගොස් ඇති බවත්, එහි සඳහන් වන්නේ මෙම පුවරු අනවසරයෙන් සවිකර ඇති බවත්, එම පුවරු එම ස්ථානයේ දිගටම තබා ගැනීමට නම් ගෙවීමක් කළ යුතු බව දන්වා දුරකතන අංකයක් සඳහන් කර ඇති

බවත්, ඒ පිළිබඳ ආදායම් පරීක්ෂක නුවන් මහතාගෙන් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී,

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.00 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ආදායම් පරීක්ෂක, බී. එන්. ඩී. උපාලි මහතා</u>

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ගාලු පාර දෙපස කලාපයේ පවතින දැන්වීම් පුවරුවලට එම ආයතනයටත් වර්ග මීටරයකට ගාස්තුවක් ගෙවන ලෙස මෙම දැන්වීම් අලවා ඇති බවත්, නමුත් මෙතෙක් එම කලාපයේ පුවරු සවි කිරීමේ දී මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරයක් ලබා ගත යුතු බවට සභාව දැනුවත් කර නොමැති බවත්, මහා මාර්ගයකට, ඇළ මාර්ගයකට හෝ දුම්රිය මාර්ගයකට මුහුණලා ප්‍රචාරණය කරනු ලබන පුවරුවක් සඳහා දැනට සභාව විසින් ගාස්තු අය කරනු ලබන බවත් මෙහි දී පැහැදිලි කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

රජය විසින් සියලු රාජ්‍ය ආයතන වෙත ආදායම් උපද්දවා ගන්නා ලෙසට දැනුවත් කර ඇති බවත්, මෙතෙක් කලක් තමන්ට නොලැබුණු ආදායම් ලබා ගැනීමට සියලු ආයතන ප්‍රධානීන් කටයුතු කරමින් පවතින බවත්, මෙය එහි ප්‍රතිඵලයක් වන බවත්, සභාව විසින් අය කරනු ලබන ගාස්තුවල වෙනසක් මේ නිසා සිදු නොවන බවත්, එම පුවරු හිමි පුද්ගලයින් මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍ය මුදල් ප්‍රමාණ ගෙවා එම පුවරු නීත්‍යානුකූල කර ගැනීම් සිදු කරගත යුතු බවටත් මෙහි දී සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.05 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>

වසර ගණනක සිට වසන්ත අස්සල ආරච්චි මහතාගේ නිවස පිටුපස අයිතිකාරයෙකු නොමැතිව වතුර ටැංකියක් පවතින බවත්, එය සභාවට අයත් වූවක් වන බව අසල නිවැසියෙකු පැවසූ බවත්, ඒ පිළිබඳ සොයා බලන ලෙසටත්, එසේම බෙන්තොට ගාමිණී විද්‍යාලය හා ඇල්පිටිය ආනන්ද විද්‍යාලය අතර වාර්ෂිකව පැවැත්වෙන හරිත නීල සංග්‍රාමයේ ප්‍රථම ධජ එසවීම වෙනුවෙන් ඒ අවට සුද්ධ පවිත්‍ර කර දීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත්, මැයි මස 14 වන දින පෙ.ව. 09.00 එම අවස්ථාවට සහභාගී වන ලෙස සියලු දෙනාට ආරාධනා කරන බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය**

මන්ත්‍රීතුමා සඳහන් කළ වතුර ටැංකිය පසුගිය සභා කාලයේ දී පැවති ජල හිඟයේ දී රතු කුරුස සංවිධානය ලබා දුන් වතුර ටැංකියක් වන බවත්, එම වතුර ටැංකිය එහි ස්ථානගත කිරීමට යෝජනා කළේ තමන් වන බවත්, මීට අමතරව සිංහරූපාගම ද ජල ටැංකියක් තිබෙන බවත්, පසුගිය කාලයේ බද්දෙගම ජල නළ පද්ධතිය මඟින් ජලය ලබා දීම සිදු කළ නිසා ජල හිඟයක් එම ප්‍රදේශයට බල නොපෑ බැවින් එම ජල ටැංකිය අවශ්‍ය නොවූ බවත්, අවශ්‍ය ඕනෑම අවස්ථාවක එම ජල ටැංකි එම ස්ථානයෙන් ලබා ගැනීමට දැනුවත් කර ඇති බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා**

වසර 26 කට පමණ පසු අම්බලන්ගොඩ බස් රථය හොරවලට පැමිණි බවත්, ඊයේ දින සිට හොරවල හංදියේ සිට ගමන් ආරම්භ කළ බවත්, මෙය වර්ෂ 2000 ට පෙර ගමන් කළ බස් රථයක් බවත්, මෙම යෝජනාව සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර මාස 7ක් 8ක් මෙම යෝජනාව හා දිගින් දිගටම ගැටී මෙය ඉටු කර ගැනීමට කටයුතු කිරීම වෙනුවෙන් මේ අවස්ථාවේ ගරු උප සභාපතිතුමන්ට විශේෂ ස්තූතියක් පුද කරන බවත්, එසේම සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති නිශාන්ත පෙරේරා මැතිතුමාට ද ස්තූතිවන්ත වන බවත්, ඒ වගේම හොරවල මීරිස්වත්ත කාණු පද්ධතිය මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මේ වන විට පිරිසිදු කිරීමට ආරම්භ කර ඇති බවත්, එය ද සම්බන්ධීකරණ කමිටුව හරහා සිදු කරන ලද්දක් වන බවත් ඒ සම්බන්ධයෙන් ද ස්තූතිවන්ත වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

**ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා**

මා වෙත ස්තූති කිරීම පිළිබඳ තාරක මන්ත්‍රීතුමන්ට ස්තූතිවන්ත වන බවත්, සම්බන්ධීකරණයට ඉදිරිපත් කළ යෝජනා කීපයක්ම මේ වන විට ඉටු කිරීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත්, මෙම යෝජනාව ඉටු කර ගැනීම සඳහා සමිත පුංචිහේවා මැතිතුමා ද සහයෝගය දැක්වීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත්, එසේම සුදුවැලිපොත බස් රථය නැවත ලබා ගැනීමට එතුමා ද යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා**

සභාපතිතුමා ඇතුළුව අපි 23 දෙනා විසින් සෑම සභා වාරයකම යෝජනා ඉදිරිපත් කරන බවත්, ඉන් ප්‍රධාන යෝජනා වන්නේ මාර්ග අලුත්වැඩියාවට අදාළ යෝජනා වන බවත්, නමුත් එක් වසමක විශාල පාරවල් ප්‍රමාණයක් පවතින බැවින් මේ සභා කාලය අවසන් වීමට ප්‍රථම එම යෝජනා ඉටු කර ගැනීම ඉතාම අපහසු වන බවත්, මැදගොඩ මන්ත්‍රීතුමා සිදු කළ සේ සුදුසු මාර්ග සඳහා තාක්ෂණ සේවා නිලධාරීන්ගේ උපදෙස් මත ABC යොදා විශාල වලවල් වසා දමා තාවකාලික විසඳුමක් හෝ ලබා දීමට හැකියාවක් පවතින්නේ නම් එය ඉතාමත් සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

ප්‍රාදේශීය සභා අරමුදල් මඟින් සියලුම මාර්ග සංවර්ධනය කිරීමේ හැකියාවක් නොමැති බවත්, පසුගිය කාල වකවාණුවල පැවති මඟ නැඟුම, දිවි නැඟුම, ගම නැඟුම, පුර නැඟුම ආදී විවිධ වැඩසටහන් හරහා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට යම් මුදලක් හිමි වූ බවත්, මීට අමතරව සෑම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුටම එවකට සිටි මුදල් අමාත්‍යවරයා විසින් වර්ෂයකට යම් මුදලක් වෙන් කළ බවත්, ඒ අනුව එක් වර්ෂයක් සඳහා මන්ත්‍රීවරයෙකුට පුද්ගලිකව ලක්ෂ 40 ක පමණ මුදලක් හිමි වූ බවත්, එම මුදල් මඟින් මාර්ග සංවර්ධනය ආදී කටයුතු සිදු කළ බවත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>**

සිංහරූපගම සිට සුද්දගොඩට ගමන් කරන ප්‍රධාන මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බවත්, මීට කාලයකට පෙර එම මාර්ගය සඳහා ලක්ෂ 40 ක පමණ මුදලක් වැයකර සකස් කළ බවත්, නැවතත් අබලන් තත්ත්වයේ පවතින බවත්, ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීමට යෝජනාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන විට මෙම මාර්ගය කාපට් කිරීම සඳහා මුදල් වෙන් වී ඇති බව හසාරා මන්ත්‍රීතුමිය දැනුම් දුන් බවත්, සභාවට එතරම් මුදලක් වැය කර එය කාපට් කිරීමේ හැකියාවක් නොමැති බැවින් එහි සංවර්ධන කටයුතු සිදු වේ යැයි බලාපොරොත්තු වුවත් මෙතෙක් එය සිදු නොවූ බවත්, මේ වන විට ඒ සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බවට තෙරතුරු ලැබුණු බවත්, ජනතාවගෙන් එල්ලවන දැඩි පීඩනය හමුවේ ජයරත්න මන්ත්‍රීතුමාගේ හා මාගේ ප්‍රතිපාදන මුදල් සියල්ල වෙන්කර හෝ මෙම මාර්ගයේ කඩතොළු සඳහා ප්‍රිමික්ස් යෙදීමට පවා සිතූ නමුත් මෙම වාතාවරණය හමුවේ එසේ සිදු කළ විට කාපට් කිරීමට වෙන් වූ මාර්ගයේ ප්‍රිමික්ස් යෙදීම නිසා කාපට් මාර්ගය අහිමි වූ බවට  ජනතාව අතර මතයක් ගොඩනැගීමේ ඉඩ වැඩි වන නිසා මහත් අපහසුතාවයකට පත්ව ඇති බවත් මේ නිසා කිසිම අලුත්වැඩියාවක් සිදු නොවීම නිසා තව තවත් මාර්ගය අබලන් වී ඇති බවත්, ඉදිරියේ දී ඇමතිතුමන් හා සිදු කරනු ලබන සාකච්ඡාවල දී මෙම මාර්ගය සඳහා පූර්ණ අවධානය ලබා දෙන ලෙසත්, මාර්ගය කඩනමින් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, රංජිත් ප්‍රනාන්දු මැතිතුමා</u>**

මෙම මාර්ගය යාත්‍රාමුල්ල, කෝම්මල, සිංහරූපාගම යන වසම් 03ටම අයත් වන බවත්, මෙම මාර්ගයේ සම්පූර්ණ දුර කිලෝමීටර් 1.3 ක් වන බවත්, කාපට් කිරීමට ඇස්තමේන්තුව සකස් කළ පසු මිලියන 78 ක ඇස්තමේන්තුවක් ලැබුණු බවත්, එම ඇස්තමේන්තුව අනුමත වූ බවත්, මේ දිනවල කාපට් සකස් කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පවතින ගැටලුව හේතුවෙන් තවත් ටික කාලයක් මෙහි වැඩ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>**

ගම්වැසියන් මේ සම්බන්ධව සිදු කරනු ලබන දෝෂාරෝපණය තමන්ට ද ඇසී ඇති බවත්, මෙම මාර්ගයට ආසන්නයේම පදිංචිව සිටින බැවින් මේ සම්බන්ධව දැඩිව විමසන බවත්, තව ටික කාලයකින් මෙහි වැඩ කටයුතු ආරම්භ කරන බව ගම්වැසියන් දැනුවත් කරන ලෙසත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රිමික්ස් නොමැති වූ විට අපගේ සංවර්ධන කටයුතු අඩාල වන බැවින් බාහිර පෞද්ගලික ආයතනයක් හරහා ප්‍රිමික්ස් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු වන බවත්, මතුගම හොරවල ප්‍රදේශයේ එවැනි ආයතනයක් තිබෙන බවත්, අප ආයතනයට අවශ්‍ය තරම් එමඟින් ප්‍රිමික්ස් ලබා ගැනීමේ හැකියාව පවතින බවත්, ආරච්චිමුල්ල කෝම්මල මාර්ගය සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් ලක්ෂ 36 ක මුදලක් සභාව විසින් ලබා ගෙන ඇති බවට ගම්වැසියන් සඳහන් කරන බවත්, මේ මාර්ගයට ප්‍රිමික්ස් දැමීම සඳහා කියුබ් 06 කට ලක්ෂ 20 ක පමණ මුදලක් වැය වන නිසා මේ මාර්ගය හොඳින් සංවර්ධනය කිරීමේ හැකියාව සභාව සතුවන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

ගිය වසරේ දී මේ වර්ෂයට අවශ්‍ය කරනු ලබන වාහන ඉල්ලුම් කිරීමට ආයතන වෙත දන්වා තිබුණු බවත්, තම පරිහරණය සඳහා සභාපති නිල රථයක් ලබා ගැනීමේ හැකියාව තිබුණත් සභාවේ කටයුතු වෙනුවෙන්

ගල් රෝලක්, එක්ස්කැවේටරයක්, JCB යන්ත්‍රයක් සහ ගලි බවුසරයක් පමණක් ඉල්ලුම් කළ බවත්, සභාවේ ආදායම් උත්පාදනය කර ගැනීමේ අරමුණින් තම සුබ විහරණය පසෙකලා මෙලෙස කටයුතු කළ බවත්,

**8.4.** <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම :-</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රී මර්වින් ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී සමිත පුංචිහේවා මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-</u>
මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 21 දෙනාට ස්තුතිවන්ත වන බව පවසමින් ගරු සභාපතිතුමා විසින් සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

පෙ.ව. 11.37 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

.............................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 මැයි මස මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

<u>සංශෝධන අංක 01 - ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන</u>

පසුගිය සභා වාරයේ කල් නොදුන් යෝජනා යටතේ ඉදිරිපත් කළ 5.11.5 යෝජනාවේ තක්සේරු කටයුතු සඳහා යොදා ගන්නා කම්කරුවන්ගේ වැටුප් පිළිබඳ නිශ්චිතව දක්වා නොමැති බැවින් එම යෝජනාවේ අවසාන වැකිය “එබැවින් තක්සේරු ප්‍රතිශෝධන කාර්යයට පමණක් අදාළ වන ලෙස සහ එම කටයුතු නිම වූ පසු සේවය අවසන් කිරීමට යටත්ව එනම් තත්ත්කාර්යය පදනම මත කම්කරුවන් 10 දෙනෙකු, එක් අයෙකුගේ වැටුප 2026.01.01 දිනට PL තනතුර දරන දෛනික කම්කරුවෙකුගේ වැටුප් හා දීමනා ඇතුළත්

දිනක වැටුප වන රු. 1,888.76 ක් වන ලෙස සභා අරමුදලින් ගෙවීමට යටත්ව සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි." ලෙස සංශෝධනය විය යුතුයි.

**<u>සංශෝධන අංක 02 - ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන</u>**

පසුගිය සභා වාරයේ 5.9.5 යටතේ ඉදිරිපත් කළ "දංකැටිය ජේම්ස් සමරසිංහ මාවත මීටර් 30 ක් පමණ තාර දමා අලුත්වැඩියා කිරීම" යෝජනාව "දංකැටිය ජේම්ස් සමරසිංහ මාවත මීටර් 30 ක් පමණ තාර හෝ කොන්ක්‍රීට් දමා අලුත්වැඩියා කිරීම" ලෙස සංශෝධනය විය යුතුයි.

......................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.